| 7.1 | | ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායි, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කිරීම | ලැබී ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව | | | √ |
| | | | | ලැබී ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න අතුරින් පිළිතුරු සපයා ඇති සංඛ්‍යාව | | | √ |
| 7.2 | | | අමාත්‍ය මණ්ඩල සංදේශවලට නිරීක්ෂණ සකස් කිරීම | අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළව ඉල්ලා ඇති නිරීක්ෂණ සංඛ්‍යාව | | | √ |
| | | | | අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළව ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ සංඛ්‍යාව | | | √ |
| 8 | | | දේශ සීමා/ රේගු කළමනාකරණය සඳහා පහසුකම් සැලසීම | රේගු ආඥා පනත සඳහා සිදුකළ සංශෝධන | | √ | |
| | | | | කටයුතු නිමාකළ අභියාචනා සංඛ්‍යාව | | | √ |
| 9 | | | අයවැය කතාවේ වෙළඳ ප්‍රතිපත්තියට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම | පිළියෙල කළ වාර්තා/ සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| 10 | | | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත, මූල්‍ය බුද්ධි ඒකකය හා ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ අනෙකුත් කරුණු | විදේශ විනිමය පනත සඳහා සිදුකළ සංශෝධන | | | √ |
| | | | | නිකුත් කළ නියමයන් සහ නියෝග සංඛ්‍යාව | | | √ |
| | | | | නිකුත් කළ විධිවිධාන | | | √ |
| | | | | ගැටලු විසඳීම සම්බන්ධයෙන් පහසුකම් සැලසීම | | | √ |
| 11 | | | විවිධ වාහන එකලස් කිරීමේ කටයුතු | පිළියෙල කළ වාර්තා/ සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| | | | | සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| 12 | | | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීම් | තොරතුරු ඉල්ලීම් අතුරින් අදාළ තොරතුරු ලබාදුන් සංඛ්‍යාව | | | √ |
| | | | | සලකා බැලූ අභියාචනා සංඛ්‍යාව | | | √ |
| 13 | | | මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 14 | | | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර පවත්වා ගැනීම | සම්පූර්ණ කළ කාර්යසාධන ඇගයීම් සංඛ්‍යාව | | | √ |
| | | | | ලබා දී ඇති වැටුප් වර්ධක සංඛ්‍යාව | | | √ |
| 15 | | | ප්‍රසම්පාදන කටයුතු | ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව අදාළ කටයුතු සම්පූර්ණ කළ ප්‍රසම්පාදන සංඛ්‍යාව | | | √ |
| | | | | අයවැයෙහි ප්‍රතිශතයක් ලෙස | | | √ |
| 16 | | | වාහන සංචිතය කළමනාකරණය | වර්ෂය තුළ සිදුකළ වාහන අලුත්වැඩියා කිරීම් සංඛ්‍යාව | | | √ |
| | | | | වාහන සම්බන්ධයෙන් ලැබී ඇති විගණන විමසුම් සංඛ්‍යාව | | | √ |
| 17 | | | අධිකරණ නඩු කටයුතු | නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ නිරීක්ෂණ සංඛ්‍යාව | | | √ |
| | | | | නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබාගැනීම සඳහා පැවති හමුවීම් සංඛ්‍යාව | | | √ |
| 18 | | | **මූල්‍ය කළමනාකරණය** | | | | |
| 18.1 | | | මූල්‍ය සම්පත් සැලසුම් කිරීම | උපයෝජනය කළ ප්‍රතිපාදන සමස්ත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස | | | √ |
| | | | | ලැබී ඇති අත්තිකාරම්වල වටිනාකම | | | √ |
| | | | | නියමිත කාලගත ඉලක්ක තුළ හෝ ඊට පෙර සකස් කරන ලද ගිණුම්/ සාරාංශ/ වාර්තා සංඛ්‍යාව | | | √ |
| 18.2 | | | ගනුදෙනු වාර්තා කිරීම | නියමිත කාලය තුළ සපයන ලද මාසික ගිණුම් සාරාංශ සංඛ්‍යාව | | | √ |
| | | | | පාලන ගිණුම් සහ සැසඳුම් සංඛ්‍යාව | | | √ |
| 19 | | | මෙම දෙපාර්තමේන්තුවට අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම (රජයේ විගණන, කළමනාකරණ විගණන, සහ අභ්‍යන්තර විගණන) | පිළිතුරු සපයන ලද විගණන විමසුම් සංඛ්‍යාව | | | √ |
| 20 | | | වත්කම් හා තොග ලේඛන කළමනාකරණය | තොග ලේඛනවල දක්වා ඇති අයිතම පැවතීම | | | √ |
| | | | | නියම කර ඇති කාල සීමාව තුළ භාණ්ඩ | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම | | | |
| 21 | | | උපයෝගී සේවාවන් පවත්වාගෙන යෑම (දුරකථන, ඉන්ධන, පිරිසුදු කිරීම් සේවා හා තැපැල් සේවා) | උපයෝගී සේවාවන් බිඳවැටීම් සිදුවූ සංඛ්‍යාව | | | √ |
| 22 | | | මාසික සහ කාර්තුමය ප්‍රගති වාර්තා පිළියෙල කිරීම | පිළියෙළ කළ මාසික ප්‍රගති වාර්තා සංඛ්‍යාව | | | √ |
| | | | | පිළියෙළ කළ කාර්තුමය ප්‍රගති වාර්තා සංඛ්‍යාව | | | √ |
| 23 | | | කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීම | නියම කර ඇති කාල සීමාව තුළ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීම | | | √ |
| 24 | **ඉලක්කය 12** | පාරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම සහ සියලු දෙනා සඳහා කල් පවත්නා, පූර්ණ හා තිරසර ආර්ථික වර්ධනයක්, සම්පූර්ණ හා ඵලදායි රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම | **බන්ධිත ගුදම් සම්බන්ධිත කටයුතු** | | | | |
| 24.1 | | | බන්ධිත ගුදම් සම්බන්ධිත ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම | ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව | | | √ |
| | | | | සංශෝධනය කර ස්ථාපිත කරන ලද ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සංඛ්‍යාව | | | √ |
| 24.2 | | | බන්ධි ගුදම් ස්ථාපනය කිරීම/ වෙනත් ස්ථානවල ස්ථාපනය කිරීම/ඉවත් කිරීම | බන්ධිත ගුදම් ස්ථාපනය කිරීම අවලංගු කිරීම/ වෙනත් ස්ථානවල ස්ථාපනය කිරීම්/ඉවත් කිරීම් සඳහා ලබාදී ඇති අනුමැතීන් සංඛ්‍යාව | | | √ |
| | | | | බන්ධිත ගුදම් පහසුකම් තුළ කම්හල් ස්ථාපනය කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් ලබා දී ඇති අනුකූලතා අනුමැතීන් | | | √ |
| 25 | | | විවිධ තීරුබදු සහන යටතේ ආනයනය කරනු ලැබූ මෝටර් වාහන අපහරණය කිරීම | ලබා දී ඇති අනුමැතීන් සංඛ්‍යාව | | | √ |
| 26 | | | රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් සහිත නිලධාරීන් හා පළාත් ආණ්ඩුකාරවරු සඳහා සහනදායී කොන්දේසි යටතේ මෝටර් රථ ආනයනය කිරීම සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | අදාළ චක්‍රලේඛය සඳහා සිදුකර ඇති සංශෝධන | | | √ |
| | | | | චක්‍රලේඛ අංක 01/2018 යටතේ නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | | | √ |
| | | | | පිළිතුරු සපයන ලද/ අදාළ කටයුතු සිදුකළ පැමිණිලි සහ අභියාචනා සංඛ්‍යාව | | | √ |
| | | | | ආණ්ඩුකාරවරුන් සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | චක්‍රලේඛ අංක 22/99 යටතේ නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | | | √ |
| 27 | | | අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමවල (TIEP) සිදුකළ සංශෝධන | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| | | | | පිළියෙල කළ ලේඛන සංඛ්‍යාව | | | √ |
| 28 | **ඉලක්කය 12 සහ 8** | පාරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම සහ සියලු දෙනා සඳහා කල්පවත්නා, පූර්ණ හා තිරසර ආර්ථික වර්ධනයක්, සම්පූර්ණ හා ඵලදායි රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම | **ජාතික සංවර්ධනය සඳහා තීරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම** | | | | |
| 28.1 | | | ආදායම් සංරක්ෂණ ආඥා ඇතුළත් ගැසට් නිවේදන නිකුත් කිරීම | ආදායම් සංරක්ෂණ ආඥාවට අදාළව නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |
| 28.2 | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අදාළව ගැසට් නිවේදන නිකුත් කිරීම | විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අදාළව නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |
| 28.3 | | | රේගු ආඥා පනත යටතේ රේගු ආනයන බද්ද මත අධිභාරය පැනවීමට අදාළව ගැසට් නිවේදන නිකුත් කිරීම | ආදායම් සංරක්ෂණ ආඥාවට අදාළව නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |
| 28.4 | | | සෙස් බද්දට අදාළ ගැසට් නිවේදන නිකුත් කිරීම | සෙස් බද්දට අදාළව නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | HS Codes සංස්කරණය | පිළියෙල කළ ලේඛන සංඛ්‍යාව | | | √ |
| 29 | | | | HS Codes නව සංස්කරණයට අදාළ මෙරට කටයුතු සම්පූර්ණ කිරීම | | | √ |
| 30 | | | අපනයන තීරුබදු මාර්ගෝපදේශය නිකුත් කිරීම | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| | | | | ප්‍රකාශයට පත්කරන ලද බදු සංඛ්‍යාව | | | √ |
| | | | ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ ගැසට් නිවේදන නිකුත් කිරීම | නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |
| | | | | ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 31 | **ඉලක්කය 08** | සියලු දෙනා සඳහා කල්පවත්නා, පූර්ණ හා තිරසර ආර්ථික වර්ධනයක්, සම්පූර්ණ හා ඵලදායි රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම | **කර්මාන්ත/ අනෙකුත් සංවිධානවලින් ඉදිරිපත් කරන ගැටලු සංඛ්‍යාව** | | | | |
| 31.1 | | | කර්මාන්ත/ අනෙකුත් සංවිධානවලින් ඉදිරිපත් කරනු ලැබූ වෙළඳ සහ තීරුබදු ආශ්‍රිත ගැටලු සඳහා විසඳුම් ලබාදීම | පිළියෙළ කරනු ලැබූ වාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| | | | | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| 31.2 | | | ආනයන හා අපනයන පාලන පියවරවලට අදාළ ප්‍රතිපත්තිමය ගැටලු | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| | | | | නිකුත් කරනු ලැබූ නියෝග සංඛ්‍යාව | | | √ |
| 31.3 | | | ප්‍රදාන වශයෙන් ලැබෙන ආනයනයන් නියාමනය කිරීම හා පහසුකම් සැලසීම | ලැබූ ප්‍රදානයන් සංඛ්‍යාව | | | √ |
| 31.4 | | | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අදාළව ලැබෙන ඉල්ලීම් විසඳීම | පිළියෙළ කරනු ලැබූ වාර්තා/ සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| | | | | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| 31.5 | | | කේන්ද්‍රස්ථාන නියෝග | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| | | | | පිළියෙළ කරනු ලැබූ වාර්තා/ ලිපි සංඛ්‍යාව | | | √ |
| | | | | සංවිධානය කළ/ සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| 31.6 | | | සෙස් බද්ද | පිළියෙළ කරනු ලැබූ වාර්තා/ සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| | | | | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| 31.7 | | | කොළඹ වරාය නගරය | පිළියෙළ කරනු ලැබූ වාර්තා/ සටහන්/ ලිපි සංඛ්‍යාව | | | √ |
| | | | | විසඳනු ලැබූ ගැටලු සංඛ්‍යාව | | | √ |
| 32 | | | වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | ගනුලැබූ ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව | | | √ |
| | | | | ලැබූ තාක්ෂණික සහාය | | | √ |
| | | | | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| | | | | ඉහළ මට්ටමේ ස්ථාවර | | | √ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | කමිටු විසින් පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව අනෙකුත් රැස්වීම්/වැඩමුළු සංඛ්‍යාව | | | |
| | | | | ප්‍රසම්පාදන සංඛ්‍යාව | | √ | |
| 33 | | | රේගු ආඥා පනතේ විධිවිධාන යටතේ තීරු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම | | | | |
| 33.1 | | | රේගු ආඥා පනතේ 19අ වගන්තියේ විධිවිධාන යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා භාණ්ඩ ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම | ප්‍රදානය කළ තීරු බදු ඉවත්කිරීම් සංඛ්‍යාව | | | √ |
| 33.2 | | | රේගු ආඥා පනතේ 22අ වගන්තියේ විධිවිධාන යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රති-අපනයන පදනමින් භාණ්ඩ ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම | ප්‍රදානය කළ තීරු බදු ඉවත්කිරීම් සංඛ්‍යාව | | | √ |
| | | | | ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව | | | √ |
| 33.3 | | | රේගු ආඥා පනතේ 19අ වගන්තියේ විධිවිධාන යටතේ පොදු යහපත සඳහා භාණ්ඩ ආනයනය කිරීමේ දී තීරු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම | ප්‍රදානය කළ තීරු බදු ඉවත්කිරීම් සංඛ්‍යාව | | | √ |
| 34.4 | | | රේගු ආඥා පනතේ 19අ වගන්තිය යටතේ නිකුත් කළ තීරු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ගැසට් නිවේදන නිකුත් කිරීම | නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව | | | √ |

## 06. මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

2025 දෙසැම්බර් 31 වැනි දිනට සේවක සංඛ්‍යාව

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 17 | 13 | 04 |
| තෘතීයික | 03 | 02 | 01 |
| ද්විතියික | 28 | 27 | 01 |
| ප්‍රාථමික | 15 | 13 | 02 |
| එකතුව | 63 | 55 | 08 |

### 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 63 කි. ඒ අනුව, යථොක්ත වගුව මඟින් මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය දක්වා ඇත. 2025 වර්ෂයේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 08 ක් පැවති අතර, දැනට සිටින කාර්ය මණ්ඩලය ඵලදායි අයුරින් යොදා ගැනීම ඔස්සේ දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගෙන තිබේ. දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කිරීමේදී කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් පැන නඟින සැලකිය යුතු තරමේ ගැටලුවලට මෙම දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදු නොවිණි.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තුව තුළ ස්වකීය රාජකාරි ඉටු කිරීම සඳහා සේවකයන්ගේ කුසලතා, දැනුම හා ධනාත්මක ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත්, ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා කැපවීමක් සහිත ධනාත්මක පෞරුෂත්වයකින් හෙබි තැනැත්තන් දෙපාර්තමේන්තුව තුළ වර්ධනය කරගැනීම සඳහාත් දේශීය හා විදේශීය පුහුණු ලබාදීම වැදගත් වේ. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදෙන ලදී.

**07.** අනුකූලතා වාර්තාව - **2025**

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාළ නොවේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ. | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ. | | |
| **02** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA — N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දීම. | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 171/2004 අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස්කර තිබීම | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර තිබීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කර තිබීම | අදාළ නොවේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට දිනට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ 134(2) , කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම. | අදාළ නොවේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම. | අදාළ නොවේ. | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත හා ඌණතා සහ වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකර තිබේ. | අනුකූල වේ. | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අදාළ නොවේ. | | |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර ඇත. | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 පරිච්ඡේදය අනුව සෑම මෝටර් රථයකම ඉන්ධන දහනය පිළිබඳව නැවත පරීක්ෂා කර තිබීම. | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, අදාළ වාහන සම්බන්ධිත ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාළ නොවේ. | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාළ නොවේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| 11.2 | මු .රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම. | අනුකූල වේ. | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම.* | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබිම. | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා යන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබීම. | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාළ නොවේ. | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නො කර සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම. | අදාළ නොවේ. | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ. | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය බඳවාගෙන වැටුප් ගෙවීම් සිදුකර තිබීම. | අනුකූල වේ. | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | MSD 04/2017 සහ 2017.09.20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප පියවර හරහා මහජනයා වෙත ලබා දීම හා වෙබ් අඩවිය හරහා හෝ විකල්ප පියවර ඔස්සේ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 18.1 | අංක 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව ආයතනය විසින් පුරවැසි/සේවා ලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවා ලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අර්ධ වශයෙන්අනුකූල වේ. | ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අදාළ නොවේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම හා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } TPD/B/DTIP/25/FA    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2026 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාල විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.10 ඡේදය ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා දක්වන ලද සංසන්දනාත්මක සංඛ්‍යා එම මාර්ගෝපදේශයේ 7.8 හා 7.9 ඡේද අනුව සංශෝධනය විය යුතු වුවත් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව, මූලධන වත්කම් ඉදිකිරීමේ හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීමේ වටිනාකම රු.4,488,220 ක් වූවත්, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ එම වටිනාකම රු.17,498,831 ලෙස දැක්වීමෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.13,010,611 ක් වැඩියෙන් ද, මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන මාරු කිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් වල එකතුව රු.13,010,611ක් වුවත්, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ වැය කිරීම් යටතේ එම අගය ශුන්‍ය ලෙස දැක්වීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.13,010,611 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අයත් රු.10,890,000 ක් වටිනා වාහනයක් සහ මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයත් මේස 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණද, එම වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA – 06) පවරා ගැනීම් ලෙස දක්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

(අ) ඒසීඒ - 2(i), ඒසීඒ - 2(ii), ඒසීඒ - 2(iii) යන ප්‍රකාශන වල වැය විෂයයන් 05 ක් නිවැරදිව බෙදා වෙන් නොකර එකතුවක් ලෙස දක්වා තිබුණු අතර, එම වැය විෂයයන්ට අදාලව අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන, මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම්, මුළු ශුද්ධ ප්‍රතිපාදන, මුළු වියදම යනා දි තොරතුරු වෙන් වෙන්ව දක්වා නොතිබුණි. ඒසේම, ඒසීඒ - 2(iii) ප්‍රකාශනයෙහි අංක 244-1-1-0-1002 හා අංක 244-1-1-0-1202-009 දරන වැය විෂයයන්ට අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනසට හේතු දක්වා නොතිබුණි.

(ආ) ඒසීඒ - 2 (ii) ප්‍රකාශනයෙහි පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට අදාල මුළු එකතුව රු. 6,800,000 ක් වූවත්, එය ශුන්‍ය ලෙස දක්වා තිබුණි.

(ඇ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 51.1ට අනුව, අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් “බී” ගිණුමට කරන ලද බැරකිරීම්වල එකතුව රු.1,808,270ක් වුවත්, එම ශේෂය අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතන විසින් අත්තිකාරම් “බී” ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් ලෙස අග්‍රිම ගැලපුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව, දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව, පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.2 බැඳීම් හා බැරකම්

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මුදල් රෙගුලාසි 94 (i) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය-ඇමුණුම (iii) අනුව, අංක 244-01-001-2509 දරන වැය විෂයයට අදාලව බැඳීම් හා බැරකම් වල වටිනාකම රු. 1,446,556 ක් වුවත්, බැඳීම් හා බැරකම් ලේඛණයට අනුව එම ශේෂය රු. 55,351 ක් වීමෙන් රු. 1,391,165 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මුදල් රෙගුලාසි 94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එලඹෙන ලද බැඳීම් ප්‍රකාශනය-ඇමුණුම (iv) අනුව, බැරකම්වල එකතුව රු.1,912,827 ක් වුවද, බැරකම් ලේඛණයට අනුව, එම ශේෂය රු.965,146 ක් වීමෙන් රු.947,681 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396 (ඈ) රෙගුලාසිය ප්‍රකාරව 2025 මාර්තු 19 දිනැති අංක 339492 දරන රු.162,552 ක් වටිනාකමැති චෙක්පතේ වලංගු කාලය 2025 දෙසැම්බර් 31 දින වන විට මාස 06ක් ඉක්මවා තිබුණද එම චෙක්පත සම්බන්ධයෙන් උක්ත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (South Asia Free Trade Agreement) – SAFTA**

සාර්ක් කලාපීය රටවල් 8 ක සහභාගීත්වයෙන් පිහිටුවාගෙන ඇති දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (සැෆ්තා / SAFTA) සඳහා ශ්‍රී ලංකාව 2005 වර්ෂයේදී අත්සන් කර තිබුණි. මෙම වෙළඳ ගිවිසුමේ වෙළඳාම ලිහිල්කරණ වැඩසටහනේ දෙවන අදියර අවසාන බාණ්ඩය යටතේ සකස් වී ඇති රේගු සංකේතාංක 50 (සංකේත 8කින් යුත්) ක් සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන තීරු බදු කපා හැරීම සියයට 7.5 හා සියයට 6 ක ප්‍රමාණය 2018 දෙසැම්බර් මාසය වන විට සියයට 5 දක්වා අඩු කිරීමට යෝජනා වී තිබුණි. කෙසේ වෙතත්, මෙම ගිවිසුමට අදාල රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා එම සාමාජික රටවල සහභාගිත්වයෙන් සිදු වී නොමැති බැවින්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකී කටයුතු ඉටුකිරීමට හෝ අවශ්‍ය උචිත එකඟතාවයන් වෙත එළඹීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.

(ආ) **බංගලාදේශය - ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA)**

ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වරණීය වෙළඳ ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් වන සාකච්ඡා ආරම්භ කිරීම සඳහා 2021 ජුනි 14 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී තිබුණි. එම කාර්යයට අදාළව ඉදිරිපත් කර තිබූ දත්ත අනුව, 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වෙළඳාමෙන් යහපත් වෙළඳ ශේෂයන් සහ ඉහළ ආනයන ආවරණ අනුපාතයක් දෙරට අතර වෙළඳාම මඟින් අත් කර ගෙන තිබුණි. ඒ අනුව, බංගලාදේශය හා ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA) අත්සන් කිරීමට අදාළ වැඩ සැලැස්මක් (Work Plan) සඳහා එකඟතාවයකට පැමිණ, දෙරට අතර ගිවිසුම අත්සන් කිරීම 2022 ජනවාරි මසට යෙදී තිබුණ ද, 2025 දෙසැම්බර් 31 දින වන විටත් එම ගිවිසුම අත්සන් කර නොතිබුණි.

(ඇ) **චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම**

චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ එකඟතාවයට එළඹීම සම්බන්ධ සාකච්ඡා 2014 වර්ෂයේ ආරම්භ වී 2017 වර්ෂය දක්වා පවත්වා තිබුණි. 2022 වර්ෂයේදී සාකච්ඡා නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර, 2025 දෙසැම්බර් 31 දින වන විටත් එය සාකච්ඡා මට්ටමේ පැවතිණි.

## 4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

### 4.2.1 වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (Trade National Single Window System Project)

විදේශ සංවර්ධන මූල්‍ය සහාය යටතේ "වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා 2022 ජූනි 08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4 ඡේදයෙහි සඳහන් 4.1, 4.2, 4.3, 4.4 සහ 4.5 යෝජනා සඳහා 2022 ජූනි 21 දිනැති අංක 22/0801/504/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4.4 හි සඳහන් යෝජනා අනුව මුදල් අමාත්‍යාංශය යටතේ පවතින ඒකාබද්ධ අරමුදලින් මූල්‍යනය කිරීම මගින් වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ මූලික අදියර (Preliminary Stage) ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණි. 2024 ඔක්තෝබර් 01 දින සිට 2027 සැප්තැම්බර් 30 දක්වා අවුරුදු 3 කාලසීමාවක් සඳහා පිරිවැය රු. මිලියන 5,926 ක් ඇස්තමේන්තුකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු. මිලියන 200.4 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම

(i) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, වෙළඳ ජාතික තනි කවුළු ව්‍යාපෘතියේ 2025 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා ඉහත ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) 2025 වර්ෂය සඳහා මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. 200,400,000 ක් වුවත්, ප්‍රසම්පාදන සැලැස්ම අනුව, ප්‍රසම්පාදන කාර්යයන් වෙනුවෙන් රු. 2,511,540,000 ක් සැලසුම් කර තිබීමෙන් මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

(iii) ප්‍රසම්පාදනයන්ට අදාලව ප්‍රගතිය ඉදිරිපත් කිරීමේ දී සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු. 3,009,842,520 ක් ලෙස පිළියෙල කර තිබුණ ද ඒ සඳහා සංශෝධිත ප්‍රතිපාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කර ගෙන නොතිබුණි.

(ආ) මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම

වසර 03ක කාලයක් සඳහා ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් මෙහෙයුම් කල්බදු පදනම යටතේ වෑන් රථයක්, වසර 03 ක කාලයක් සඳහා එකතුව රු. 10,620,000 (වැට් රහිත) කල් බදු වටිනාකමකට පෞද්ගලික සමාගමක් වෙතින් ලබා ගැනීමට 2025 අප්‍රේල් 2 1 දින ගිවිසුම්ගත වී තිබුණි. ටෙන්ඩර් කැඳවීමට අදාල පුවත්පත් දැන්වීම අනුව, අවම වශයෙන් මසකට කි.මී 3,000 ක් ධාවනය කල යුතු ලෙස සඳහන් කර තිබුණ ද, 2025

මැයි සිට දෙසැම්බර් දක්වා කාලය තුල කි.මී 341 ත් කි.මී.1,639 ත් අතර දුර ප්‍රමාණයක් පමණක් ධාවනය කර තිබූ බව ධාවන සටහන්පත් පරික්ෂාවේදි නිරීක්ෂණය විය. ඒ අනුව, ඉහත කාලයට අදාලව ධාවනය කල යුතු මුළු දුර (කි.මී) හා ධාවනය කල මුළු දුර ප්‍රමාණය සැලකීමේදී කි.මී 15,669 ක් ඌණ උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය.

## 4.3 වත්කම් කළමනාකරණය

2023 අගෝස්තු 24 දිනැති අංක 06/2023 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 03වන ජේදය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල පවතින වාහනවල අත්‍යාවශ්‍ය තොරතුරු වාර්තා කිරීම සඳහා වන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය. එම චක්‍රලේඛයේ ජේද අංක 04 (iii) (ආ) ප්‍රකාරව, නීත්‍යානුකූල අයිතිය පිළිබඳ සැලකීමකින් තොරව, අදාල ආයතනයෙහි පවතින සියලුම වාහන පරිශීලන අත්පොතෙහි ලබා දී ඇති උපදෙස් හා මගපෙන්වීම් අනුව මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි ඇතුලත් කල යුතු වුවත් 2025 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබූ වාහන 02 ක් සම්බන්ධයෙන් එලෙස වාර්තා කර නොතිබුණි.

## 4.4 රජයේ නිලධාරින්ගේ ඇප තැබීම

(අ) මුදල් රෙගුලාසි 880 (i) ප්‍රකාරව, රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් 2025 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 12 දෙනෙකු විසින් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 881(i) ප්‍රකාරව, ඇප තැබිය යුතු තනතුරකට නිලධාරියකු පත්කිරීමේදී එකී නිලධාරියා විසින් එම තනතුරට පත්කළ දින සිට දෙමසක් ඇතුලත ඇප තැබීමක් කළ යුතු වේ. එමෙන්ම මුදල් රෙගුලාසි 881(ii) ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය සිය යටත් නිලධාරීන් නියමිත කාල සීමාව ඇතුළත එසේ ක්‍රියා කරන බවට ආයතන ප්‍රධානීන් විසින් වග බලා ගත යුතු වේ. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 11 දෙනෙකු විසින් ඇප තැබීමේ තනතුරට පත් වී 2025 දෙසැම්බර් 31 දින වන විටත් මාස 03 සිට මාස 73 ක කාලයක් ගත වී තිබුණත් ඉහත පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 883 ප්‍රකාරව, ඇප තැබීමට අවශ්‍ය තනතුරුවලට කර ඇති සියලුම අළුත් පත්වීම් සහ ඇප තබා ඇති නිලධාරීන් පිළිබඳ මාරු කිරීම්, ඉල්ලා අස් වීම්, සේවයෙන් පහ කිරීම්, මිය යෑම් යනාදිය සම්බන්ධයෙන් සෑම මාසයක් පාසාම විගණකාධිපතිවරයා දැනුවත් කළ යුතු වූවත්, 2025 වර්ෂය තුළ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව, ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරින්ගේ නම් අකාරාදි ක්‍රමයට පිළියෙල කර තුන් වන ලිත් වර්ෂය අවසානයට පසුව යෙදෙන පෙබරවාරි 15

දිනට පෙර සංශෝධිත වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**5. කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය**

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගීකරණය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 13 | 04 |
| තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| ද්විතියික මට්ටම | 28 | 27 | 01 |
| ප්‍රාථමික මට්ටම | 15 | 13 | 02 |
| **එකතුව** | **63** | **55** | **08** |

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 01 ක් පැවති අතර පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට 2025 වර්ෂය තුල දී දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට